**වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝම්බර් 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2. තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වැලිවිටිය-දිවිතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

**1.3.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
**-----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ රු.154,799 ක් වූ හිඟ අක්කර බදු ශේෂයෙන් රු.93,119 ක මුදලක් වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂ වලදී නිම කර තිබුණු කර්මාන්ත 07 කට අදාළව ගෙවිය යුතු රු.4,018,638 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී පියවර ගෙන නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**
----------------------------------

2006 අප්‍රේල් 15 දිනට පෙර ඉටු කර තිබුණු රු.84,643 ක් වූ කර්මාන්ත 03 ක් සඳහා ගෙවිය යුතු මුදලට අදාළ කිසිදු ලිපිගොනුවක් හෝ වෙනත් කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 1.3.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන නීති, රීති, සහ රෙගුලාසි විධිවිධාන වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| (අ) **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | |
| (i) රීති 33 | අක්කර බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 59 | සභා බලප්‍රදේශය තුළ සමීක්ෂණ පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.5,778,929 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,487,077 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,291,852 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට ආදායම් විෂයයන් 05 ක රු.3,370,467 ක වැඩිවීම හා වියදම් විෂයයන් 04 ක රු.607,279 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික අනුපාත සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කරන නමුත්, ණයගැති ශේෂය තුළ අය නොවී පවතින රු.12,715,645 ක ශේෂයක් සහ නිරවුල් කිරීම ප්‍රමාද වෙමින් පවතින රු.4,018,638 ක ණයහිමි ශේෂ පැවැතීමෙන් එම අනුපාතයන් මඟින් පෙන්නුම් කරන ආකාරයට ද්‍රවශීලතා තත්ත්වයක් නොමැති බව නිරීක්ෂණය වේ.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 අක්කර බදු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ වලට අදාළව අයකර ගතයුතුව තිබුණු රු.175,872 ක් වූ අක්කර බදු මුදලින් වර්ෂය අවසාන වනවිට රු.104,596 ක හිඟ ශේෂයක් පැවතුණි. ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) ඡේදය පරිදි හිඟ මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කර නොතිබුණි.

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට මුද්දර ගාස්තු සම්බන්ධයෙන් රු.20,495,938ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.87,500ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ රු.1,416,700 ක කුලී ආදායමක් හා රු.615,500 ක වරෙන්තු ගාස්තු හා දඩ ආදායමක් උපයා ගැනීම අපේක්ෂා කර තිබුණු නමුත්, වර්ෂය තුළ උපයා තිබුණේ පිළිවෙලින් රු.556,420 ක් සහ රු.120,203 ක ආදායමක් පමණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 06 ක පැවති පුරප්පාඩු පුරවා ගැනීමට හා අතිරික්ත තනතුරු 02 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු බැංකු ජංගම ගිණුම් 02 හි සමාලෝචිත වර්ෂයට රු.3,386,833 ක් වූ මාසික සාමාන්‍ය ශේෂයක් පැවැති නමුත්, එම අතිරික්ත මුදල් ආයෝජනය කර පොලී ආදායම් උපයා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**වීථි පහන් සඳහා වූ මුදල් ප්‍රතිපූර්ණය කර නොගැනීම**

2010 අගෝස්තු 17 දිනැති අංක PE/01/01 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබා නොගෙන විදුලි පහන් ස්ථාපිත කිරීම නිසා ඒ වෙනුවෙන් දරන ලද රු.176,490 ක් වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

**3.4 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ සඳහන් පරිදි අංක LE-7470 දරන ලැන්ඩ් කෲසර් වාහනය සහ විදුලිජනන යන්ත්‍රය අළුත්වැඩියා කර, භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු නොකර, සභා භූමියේ අනාරක්ෂිතව පැවැතුණි.

**3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බලප්‍රදේශයේ තෝරාගත් ප්‍රදේශයක පමණක් කසළ වෙන්කර එකතු කරන අතර, නිසි ක්‍රමවේදයකින් තොරව කසළ බැහැර කිරීම නිසා ප්‍රදේශයේ මැසි සහ මදුරු සණත්වය ඉහල ගොස් තිබුණි.

(ආ) තද බෑවුම් සහිත ඉඩමකට කසළ බැහැර කරනු ලබන අතර, එම ඉඩමට ප්‍රවේශ වීම අපහසු බැවින් ප්‍රවේශ මාර්ගය ආසන්නයේම කසළ බැහැර කර තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 හා 94 වගන්ති ප්‍රකාරව කසළ බැහැර කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් ආදායම් විෂයයන් 05 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.8,594,539 ක් වූ අතර, තවත් ආදායම් විෂයයන් 02 ක හිතකර විචලයන්ගේ එකතුව රු.561,573 ක් විය. මේ නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/ 01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

--------------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය හා ලේඛන නඩත්තු කිරීම | (i) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛන සමඟ සභාව විසින් නඩත්තු කර තිබුණු ලේඛන නොගැලපුණි. |
| | | (ii) | හානි පිළිබඳ ලේඛන පවත්වා නොතිබුණි. |
| (ආ) | වාහන පාලනය | (i) | වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| | | (iii) | නිෂ්ක්‍රීය වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (ii) | මුද්දර ගාස්තු ආදායම් යාවත්කාලීනව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | නව ආදායම් උත්පාදන වැඩසටහන් කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි. |
| | | (iv) | සංවර්ධිත ප්‍රදේශ ගැසට් කර, වරිපනම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | අයවැය පාලනය | (i) | වියදම් විෂයයක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. |
| | | (ii) | තවත් වියදම් විෂයයක අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වියදම් දරා තිබුණි. |
| | | (iii) | ආදායම් විෂයයන් 05 ක ආදායම් ඉලක්ක ළඟා කරගෙන නොතිබුණි. |

(iv) ආදායම් හා වියදම් පිළිබඳව පසු විපරම් කර, අයවැය ලේඛනය සංශෝධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ඉ) ලැබිය යුතු ගිණුම් දීර්ඝ කාලයක සිට පැවත එන ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.